1.9 විශේෂාංග රූප සටහන

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් (IMF-EFF) වැඩසටහනේ ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ වසර 4ක ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම 2023 වසරේ මාර්තු මාසයේ දී අනුමත කරන ලද අතර, එය දැනට සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහනේ මූලික අරමුණු වන්නේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථාතත්වයට පත්කිරීම, ණය තිරසාරභාවය, බාහිර ස්වාරක්ෂක නැවත ගොඩනැගීම, මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම, පාලනය ශක්තිමත් කිරීම, සහ වර්ධනය කෙරෙහි නැඹුරු ප්‍රතිසංස්කරණ වැඩි දියුණු කිරීමයි.

විස්තීර්ණ ණය පහසුකම යටතේ ජා.මූ. අරමුදල විසින් විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 2.286ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) ලබා දීමට එකඟ වී සිටී. මේ දක්වා සමාලෝචන හතරක් සාර්ථකව නිම කිරීමෙන්, ශ්‍රී ලංකාවට වි.ගැ.හි. බිලියන 1.27ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.74ක් පමණ, වාරික පහකින්) ලැබී ඇත. මේ දක්වා ලබා ඇති සාර්ථකත්වයන් අතරට ඉතා යහපත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව, පාලනය වූ උද්ධමනය, ශක්තිමත් සංචිත තත්ත්වය, සහ පාලනයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ පිරිවැය පිළිබිඹු කරන මිලකරණය ඇතුළත් වේ. පස්වන[1] සහ හයවන සමාලෝචන අවසන් වීමත් සමඟ වැඩසටහන යටතේ හයවන සහ හත්වන වාරික ඉදිරි මාසවල දී ලබා ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරන අතර, සමස්ත වැඩසටහන 2027 වසරේ දී අවසන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තව ද, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් කඩිනම් මූල්‍යන උපකරණය (Rapid Financing Instrument) යටතේ හදිසි මූල්‍යනය ලබා දීම අනුමත කළ අතර, එමගින් ශ්‍රී ලංකාවට වි.ගැ.හි. මිලියන 150.5ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 206ක්) වෙත ක්ෂණික ප්‍රවේශයක් ලබා ගත හැකි විය. සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගනිමින් දිට්වා සුළි කුණාටුවේ දැඩි බලපෑම් හේතුවෙන් පැන නගින හදිසි අවශ්‍යතා සපුරා ගැනීමට කඩිනම් මූල්‍යන උපකරණය රටට උපකාරී විය.

### ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩසටහනෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත

| මාර්. 2022 | සැප්. 2022 | මාර්. 2023 | ඔක්. 2023 | දෙසැ. 2023 | මාර්. 2024 | ජූනි 2024 |
|---|---|---|---|---|---|---|
| ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සඳහා ඉල්ලුම් කිරීම | කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම | ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය පළමු වාරිකය | කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම පළමු සමාලෝචනය | ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය දෙවන වාරිකය | කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම දෙවන සමාලෝචනය | ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය තෙවන වාරිකය |

පළමු වාරිකය | දෙවන වාරිකය | තෙවන වාරිකය

| නොවැ. 2024 | මාර්. 2025 | අප්‍රේ. 2025 | ජූලි 2025 | දෙසැ. 2025 |
|---|---|---|---|---|
| කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම තෙවන සමාලෝචනය | ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය සිව්වන වාරිකය | කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම සිව්වන සමාලෝචනය | ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය පස්වන වාරිකය | කඩිනම් මූල්‍යන උපකරණය යටතේ මූල්‍යන පහසුකම මුදා හැරීම |

සිව්වන වාරිකය | පස්වන වාරිකය

- මේ දක්වා විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ මුළු ලැබීම්: වි.ගැ.හි. බිලියන 1.27 (එ.ජ. ඩොලර් බිලියන 1.74).
- දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ හදිසි ගෙවුම් තුලන සහ රාජ්‍ය මූල්‍ය පීඩන සඳහා පිළියම් යෙදීමට 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී කඩිනම් මූල්‍යන උපකරණය යටතේ වි.ගැ.හි. මිලියන 150.5ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 206ක් පමණ) මුදා හරින ලදී.

1 දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ආර්ථික බලපෑම සහ ඒ සඳහා සුදුසු ප්‍රතිපත්ති ප්‍රතිචාරය තක්සේරු කිරීමට ඉඩ සැලසීම සඳහා 2025 වසරේ දෙසැම්බර් මස වන විට අවසන් කිරීමට නියමිතව තිබූ පස්වන සමාලෝචනය කෙටිකාලයකින් ප්‍රමාද කරන ලදී.